රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 17/93(1)

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994 ජුනි මස 07 වැනි දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 371 හි විධිවිධාන පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීමේදී සිදුවී ඇති විෂමතාවයන් ඉවත් කිරීම.**

උක්ත කරුණ පිළිබඳව නිකුත් කරන ලද අංක. 17/93 හා 1993 අගෝස්තු 13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ දෙවන ඡේදයෙහි අංක IV උප වගන්තියට පසුව අංක. V වශයෙන් දැක්වෙන උප වගන්තිය එකතු කිරීමෙන්, එම චක්‍රලේඛනය සංශෝධනය කෙරේ.

"V. 1982 ජුනි 01 වන දින හෝ ඊට පසු සේවයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියෙකු සම්බන්ධයෙන් පමණක්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පවත්වන පොදු කළමණාකරණ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම."

03. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකගත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙණිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.